# වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ප්‍රමුඛතම ඉහළ තත්ත්වයෙන් යුත් බාහිර DIP P10 LED ඩිජිටල් දැන්වීම් ප්‍රදර්ශන පුවරුවක් සැපයීම, ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙනුවෙන්, ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, පහත වගුව -1හි සඳහන් පරිදි වූ ප්‍රමුඛතම ඉහළ තත්ත්වයෙන් යුත් බාහිර DIP P10 LED ඩිජිටල් දැන්වීම් ප්‍රදර්ශන පුවරුවක් සැපයීම, ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

**වගුව 01**

| ලොට් අංකය | විස්තරය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රුපියල් | ලංසු වලංගු කාලය | ලංසු ඇපකරය ශ්‍රී ලංකා රුපියල් හා වලංගු කාලය |
|---|---|---|---|---|
| 01 | ප්‍රමුඛතම ඉහළ තත්ත්වයෙන් යුත් බාහිර DIP P10 LED ඩිජිටල් දැන්වීම් ප්‍රදර්ශන පුවරුවක් සැපයීම, ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය | 3,500.00 | දින 49<br>2026 සැප්තැම්බර් 04 දින දක්වා | 25,000.00<br>2026 ඔක්තෝබර් 02 වන දින දක්වා |

02. අදාළ කොන්ත්‍රාත්තුව, ප්‍රදාන දිනයේ සිට දින 105 තුළ සම්පූර්ණ කළ යුතුය.

03. ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

04. උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට අවශ්‍ය වැඩිදුර විස්තර වෙන්නප්පුව, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ලේකම් (දුරකථනය - 031-2255276) වෙතින් ලබාගත හැකි අතර, අදාළ ප්‍රසම්පාදන ලේඛනය, ඉහත ලිපිනයේදී රාජකාරි දිනවල, කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂා කොට බැලිය හැක. (9.00 පැය හා 15.00 පැය අතර.)

05. ඉහත වගවේ 01හි සඳහන් ආපදු නොගෙවන ගාස්තු ගෙවීමෙන් හා පහත 08 ඡේදයෙහි සඳහන් ලිපිනය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන්, 2026 ජුනි 30 දින සිට 2026 ජූලි 16 දින දක්වා, කාර්යාල වේලාවන් තුළ, රාජකාරි දිනවල, (9.00 පැය හා 16.00 පැය අතර) උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට සම්පූර්ණ ප්‍රසම්පාදන ආකෘති කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින්ම කළ යුතු වේ.

06. අදාළ පෙර - ලංසු රැස්වීම, 2026 ජූලි 10 දින පෙ.ව. 10.00ට වෙන්නප්පුව, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සම්මන්ත්‍රණ කාමරයේදී පැවැත්වීමට නියමිතය.

07. සියලුම ලංසු සමග ලංසු ලේඛනයන්හි සඳහන් නියමිත ආකෘතියෙන් යුත්, ඉහත වගුවේ සඳහන් වටිනාකමට හා වලංගු කාලයට අනුකූල වූ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් තිබිය යුතුය. එසේ ලංසු ඇපකර නොමැතිව ඉදිරිපත් කරනු ලබන ඕනෑම ලංසුවක් ප්‍රතිචාර නොදැක්වූ ඒවා ලෙස සලකනු ඇත.

08. මුද්‍රා තැබූ ලංසු, අදාළ බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ "**ප්‍රමුඛතම ඉහළ තත්ත්වයෙන් යුත් බාහිර DIP P10 LED ඩිජිටල් දැන්වීම් ප්‍රදර්ශන පුවරුවක් සැපයීම, ගෙනැවිත් භාරදීම හා ස්ථාපනය**" යනුවෙන් සඳහන් කොට, පිටපත් දෙකක් වශයෙන්, පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ වෙන්නප්පුව, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ (කළමනාකරණ අංශයේ) මේ සඳහා තබා ඇති ලංසු පෙට්ටියේ බහාලීමෙන්, 2026 ජූලි 17 දින ප.ව. 2.30ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ලංසු භාරගැනීම 2026 ජූලි 17 දින ප.ව. 2.30ට අවසන් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාරගැනීමේ කාලය අවසන්වූ වහාම පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ ශ්‍රවණාගාරයේදී විවෘත කරනු ලැබේ.

09. ලංසුකරුවන් විසින්, ලංසු ලේඛනයන්හි IV කොටසේ ඇතුළත් වංචා විරෝධී දිවුරුම් ප්‍රකාශයට අත්සන් කළ යුතුය. එසේ අදාළ දිවුරුම් ප්‍රකාශයට අත්සන් කර නොමැති ලංසුකරුවන්ගේ ලංසු ප්‍රධාන අපගමනයක් සිදු කළ එකක් ලෙස සලකා ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව,**
**වෙන්නප්පුව.**
**දුරකථනය** - 031-2255276
**ඊමේල්** - wennappuwaps@gmail.com